# පාරිසරික සාධාරණත්වයේ නීතිමය රාමුව

**නීතිඥ රවි අල්ගම**

ඔබ කවද හෝ පාරිසරික ප්‍රශ්නයක අවාසි පැත්තට වැටී ඔබට නීතිමය සහනයක් ලබාගත නොහැකිදැයි කල්පනා කොට තිබේද ? ඔබට කී වතාවක්-

(අ) අසල්වැසියෙකුගේ කුණු ගොඩකින් නගින දුම.

(ආ) එළිපහන් වනතුරුම ඔබට නිදිවරා සිටීමට සිදුවන අන්දමින් ආගමික සිද්ධස්ථානවල ක්‍රියාත්මක වන ශබ්ද විකාශන යන්ත්‍ර.

(ඇ) පොළොව තුලින් ගලායන කාර්මික අපද්‍රව්‍ය නිසා ඔබගේ වතුර බොන ළිඳ අපිරිසිදු වීම.

(ඇ) ඔබ වාසය කරන ස්ථානය අසළ දූෂණ ප්‍රභවයක් ස්ථාපනය කිරීම.

වැනි කරුණු ඉවසා සිටීමට සිදුවී ඇද්ද?

ඉහත සඳහන් එක් කරුණකදී හෝ එකී සියලුම කරුණුවලදී හෝ තමන්ට ඇත්තටම පිහිටක් නැද්ද කියා බොහෝ දෙනා කල්පනා කරනු ඇත.

දිනෙන් දිනම රටවැසියන් මුහුණදෙන විවිධාකාර පාරිසරික දුක්ගැනවිලි වලින් මෙකී ගැටළුවලට පිළියම් වශයෙන් නීතියෙන් සහ පරිපාලන ආයතනවල ඉල්ලීම මත ලබාගත හැකි සහන ද පිළිබඳව අවධානය යොමු කිරීම මේ ලිපියෙන් අපේක්ෂා කෙරේ.

**පීඩා**

පාරිසරික දුක් ගැනවිලි විශාල සංඛ්‍යාවක් මහජන පීඩා ගනයට ඇතුළත් වේ. මහජන පීඩාව යන්නට ඇතුළත් වන ප්‍රධාන මූලධර්ම පිළිබඳ සාකච්ඡා කිරීමත් මෙවැනි අවස්ථාවකදී කෙනෙකු අනුගමනය කළයුතු කාර්ය පටිපාටිය ඉදිරිපත් කිරීමත් අරමුණු කොට මෙම ලිපිය සකස් කළෙමි.

පළමු කොටම කෙනෙකු ප්‍රදේශයේ පොලිස් ස්ථානයට පැමිණිල්ලක් කොට පීඩාව මග හරවා ගැනීමට පොලිසියේ සහය ඉල්ලා සිටීම වැදගත් වේ. වරදකරුට එරෙහිව අධිකරණයේ නඩු පැවරීම මගින් මහජන පීඩා නීතිය ක්‍රියාවේ යොදවන ලෙස නියම කරමින් මෑතකදී පොලිස්පති විසින් සියලුම පොලිස් ස්ථානවලට චක්‍රලේඛයක් නිකුත් කරනු ලැබ ඇත. පුරවැසියන්ගේ මතය වනුයේ පීඩාව දුරලීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98 වැනි වගන්තිය යටතේ නඩු පවරන ලෙස පොලිසියට නියම කරනු ලැබිය යුතුබව ය.

දෙවැනිව ගැටළුව පිළිබඳව ප්‍රාදේශීය බල මණ්ඩලයට දැනුම් දිය යුතුය. මහජන පීඩාවක් හඳුනා ගෙන ඒවා මග හැරවීම සඳහා කලින් කලට තම ප්‍රදේශය පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය සභා හෝ වෙවා මහනගර සභා නැතහොත් සුළු නගර සභා හෝ වෙවා සියලුම ප්‍රාදේශීය බල මණ්ඩල නීතිය යටතේ බැඳී සිටිති.

මේ අවස්ථාවේදී මධ්‍යම පරිසර අධිකාරිය බැහැර කොට තැබීම අතිශයින්ම වැදගත් වේ. මක්නිසාද යතහොත් මේ ගැටළුව ගැන ක්‍රියා කිරීම තවමත් ඊට අයත් කාර්යයක් නොවන බැවිනි. බොහෝ දෙනා පොදුවේ කරන වරදක් නම් තමන්ගේ ලියකියවිලි වල පිටපතක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත යැවීමය. මෙයින් සිදුවන්නේ බොහෝ ආයතනවල වැඩ ද්විගුණවීමත්, මධ්‍යම පරිසර අධිකාරියේ වැඩ වැඩිවීමත් රජයේ කාලය සහ මුදල් අපතේ යාමත්, එමෙන්ම නිත්‍යානුකූල රාජකාරියේ දෘෂ්ඨිකේන්ද්‍රය විකම්පිත වී යාමත්ය.

කෙසේ නමුත්, බොහෝ අවස්ථාවලදී, මහජනයා පොලීසියට සහ ප්‍රාදේශීය බල මණ්ඩලයට පැමිණිලි කොට ඇතත්, කිසිවක් සිදුවී නැත. එසේ නැතහොත්, ඔවුන් ක්‍රියා කිරීමට පටන් ගෙන ඇතත්, පසුව යම් දූෂිත ගනුදෙනුවක හෝ දේශපාලන බලපෑමක හෝ ගොදුරු බවට පත්වී ඇත.

**නීතිමය ප්‍රතිකර්ම :**

මේ අවස්ථාවේ පුරවැසියෙකුට ගතහැකි නීතිමය ප්‍රතිකර්ම :

(අ) පීඩාව දුරු කිරීම සඳහා තම නීතිමය වගකීම ක්‍රියාවේ යොදවන ලෙස පොලිසියට හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයට එරෙහිව මැන්ඩාමුස් ආඥාවක් මගින් කටයුතු කිරීම.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ යෝජනාව මත මැන්ඩාමුස් ආඥාවකින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි (අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව) ජාතික පාරිසරික පනතේ 12 වැනි වගන්තිය යටතේ විධානයක් කරන මෙන් මධ්‍යම පරිසර අධිකාරියෙන් ලිඛිතව ඉල්ලීමක් කිරීම සහ

(ඇ) වරදකරුට එරෙහිව පුරවැසියාට තමන් විසින්ම මහේස්ත්‍රාත් අධිකරණයෙහි සහ එමෙන්ම දිසා අධිකරණයෙහි ද නඩු පැවරිය හැකිය. (මින් දෙවැනි ක්‍රියා මාර්ගයේදී කෙනෙකුට පෞද්ගලික පීඩාවකදී වුවද වාරණ නියෝග ලබාගැනීම සඳහා ක්‍රියා කළ හැකිය.) මහේස්ත්‍රාත් අධිකරණයට ද වාරණ නියෝගයක් මගින් සහන ලබාදීම සඳහා සීමිත බලතල ඇත.

**පරිපාලනමය ප්‍රතිකර්ම** :

ඉහත සඳහන් කරන ලද නීතිමය ප්‍රතිකර්මවලට අමතරව කෙනෙකුට වෙනත් ප්‍රතිකර්ම ද ඇත.

(අ) ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් දිස්ත්‍රික් පාරිසරික නීති ක්‍රියාවේ යෙදවීමේ කමිටුවට පැමිණිලි කිරීම. දිස්ත්‍රික්කයේ ඉහළම පොලිස් නිළධාරියා (නියෝජ්‍ය පොලිස්පති) ද සියලුම ප්‍රාදේශීය බල මණ්ඩලවල ප්‍රධානීහු ද, මධ්‍යම පරිසර අධිකාරියද, වෙනත් නිලධාරිහු ද මේ කමිටුවට අයත් වෙති.

මේ කමිටුවේ කාර්යය වනුයේ පාරිසරික කරුණු පිළිබඳ මහජන පැමිණිලි භාර ගැනීමත් අදාළ පොලිසිය සහ ප්‍රාදේශීය බල

මණ්ඩලය ද විසින් ඒ ගැන පරීක්ෂා කර බලා උචිත පරිදි අධිකරණමය නීති කෘත්‍යයන් ආරම්භ කරන බවට සහතික වීමත් ය.

(ආ) පොලිස් මූලස්ථානයේ අධ්‍යක්ෂ (අපරාධ) ට ලියා දැන්වීම පාරිසරික කටයුතු පිළිබඳ මැදිරියක් මෙකී දෙපාර්තමේන්තුවෙහි දැනට පිහිටුවා ඇත.

**පීඩා ගනයට අයත් නොවන පාරිසරික ගැටළු :**

මේ ශීර්ෂය යටතේ සලකා බලනු ලබන්නේ පොදුවේ පරිසරය කෙරෙහි බලපාන එහෙත් ඇතැම් විට, නිශ්චිත පුද්ගලයෙකුට බල නොපාන ගැටළුය.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමය සහ පාරිසරික බලපෑම් තක්සේරු යෝජනා ක්‍රමය, නීතිමය ප්‍රතිකර්ම යම් පුද්ගලයෙකු කෙරෙහි ඇතිවන බලපෑම මත රඳා නොපවතින අවස්ථා පිළිබඳ නිදසුන් ය. පරිසරයට විමෝචනය කරන, තැන්පත් කරන හෝ මුදා හරින සෑම තැනැත්තෙකුම එකී කටයුත්ත සඳහා බලපත්‍රයක් ලබාගත යුතු බවට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර යෝජනා ක්‍රමයෙන් විධානාත්මක කෙරෙන මෙකී බලපත්‍ර කාර්ය පටිපාටිය ම. ප. අ. (දූෂණය අඩු කර්මාන්ත සම්බන්ධයෙන් නම් මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලය පවරනු ලැබූ ප්‍රාදේශීය බල මණ්ඩල විසින්) ක්‍රියාවේ යොදවනු ලබන අතර, එහි නිළධාරීන් දූෂණ මූලාශ්‍රය ඇති ස්ථාන කරා ගොස් පරීක්ෂණ පවත්වා යම් යම් කොන්දේසි වලට යටත්ව බලපත්‍ර නිකුත් කරන අතර, එකී කොන්දේසි බලපත්‍රයේම කොටසක් බවට පත්වේ. දූෂණයේ ප්‍රභවය අසල්වාසීන්ට හෝ සෙසු මහජනතාවට හෝ බලපෑමක් ඇතිවන අයුරින් පිහිටා ඇතිවිට, බලපත්‍රය නිකුත් කිරීමට පෙර මධ්‍යම පරිසර අධිකාරිය එසේ බලපෑමට ලක්වන ජන කොට්ඨාශය හමුවී සාකච්ඡා කළයුතු බවට මෑතකදී ඇතිවූ පූර්වාදර්ශ විසින් පෙන්නුම් කරනු ලැබ ඇත. මේ අනුව බලපෑමට ලක්වූ පාර්ශවයක් පළමුවෙන් විමසා බැලිය යුතු කරුණක් නම්, දූෂකයා පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේද යන්නයි.

පාරිසරික බලපෑම් තක්සේරු නීති ඇත්ත වශයෙන්ම පිළියම් කිරීමට වඩා වැළැක්වීමේ ස්වාභාවයෙන්ම යුක්තය. මෙහිදී ගැසට් නිවේදනයේ ලේඛණගත ව ඇති යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර, ඒ සඳහා පාරිසරික අනුමැතිය ලබාගත යුතු බවට නීතියෙන් විධාන කෙරේ. මීට හේතුව නම් එකී ව්‍යාපෘති ස්වාභාවයෙන්ම අහිතකර පාරිසරික බලපෑම් ඇති ඒවා ලෙස සැලකීමය. එබැවින්, මෙකී ව්‍යාපෘති සඳහා සැබැවින්ම අනුමැතිය දෙනු ලබන්නේ ව්‍යාපෘති ගත පාරිසරික බලපෑම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් සංවර්ධකයා විසින් පිළියෙල කොට අනුමත කරන ආයතනය විසින් එය අගයනු ලැබීමෙන් පසුවය. මෙසේ අනුමැතිය දීමට පෙර, එකී වාර්තාව මහජනයාගේ අදහස් සඳහා දින 30 ක කාලයක් මහජනයාට බලා ගැනීමට සලස්වනු ලබන අතර, එකී කාලසීමාව අවසානයේදී මහජන අදහස් විමසීමක් ද කරනු ලැබිය හැකිය. ව්‍යාපෘතියක් අනුමත කලයුතු ද නැද්ද යන්නත් අනුමත කරතොත් නියම කරනු ලැබිය යුතු කොන්දේසීත් තීරණය කිරීමේදී අනුමත කරන ආයතන විසින් මහජනයාගේ අදහස් සැලකිල්ලට ගනු ලැබීමට නියමිතය. අනුමැතිය ලබා නොගෙන ලැයිස්තු ගත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම ජාතික පාරිසරික පනත උල්ලංඝනය කිරීමක් වන අතර, අධිකරණය විසින් එය වහාම නතර කරනු ලැබිය හැකිය.

ඇතැම් පාරිසරික වැරදි කොතෙක් බරපතල සහ දරුණු වියහැකි ද යතහොත් ඒවා අතිරේක වශයෙන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවට පත්විය හැකි අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විශේෂ විධිවිධාන යටතේ නඩු නිමිත්තක් වීමටද හේතුවිය හැකිය. ගල් කැඩීම නිසා අසල පදිංචි කරුවන්ට මහත් හිරිහැර සහ සෞඛ්‍ය ගැටළු මතු කළ මාතර නාවිමන ගල් වලක් පිළිබඳ නඩුවේදී මහජන යහපත උදෙසා ක්‍රියා කළ නීතිවේදීන් කණ්ඩායමක් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරමින් කියා සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ජීවත්වීමේ අයිතිය යන්නේද සෞඛ්‍ය සම්පන්නවූත් දූෂණයෙන් තොරවූත් පරිසරයකට ඇති අයිතියද අදහස් කැරෙන බවය.

පාරිසරික යුතුකම් පිළිබඳ කල්පනාවට ගැනීම සඳහා අන්තිමේදී සංස්ථා චර්යාව වෙනස් කිරීමට සිදු වන්නේ බරපතල හානි සිදුවීමෙන් පසුව පමණක් බැවින්, විශේෂයෙන්ම, වැරදි සිදු කරන සංස්ථාවලට එරෙහිව අලාභ නඩු පැවරීමද වැදගත් වේ. කෙසේ වුවද, බොහෝ අවස්ථාවන්හිදී, ගෙවීමට සිදුවනු ඇත්තේ පොදු බැරකම් රක්ෂණය විසිනි.

---

* ආසියාවේ රටවල් අතරින් ඒකක භූමි ප්‍රමාණයක උරග, උභයජීවීන්, ක්ෂීරපායීන් හා මල්පිපෙන ශාක යන ජීවී භාණ්ඩවල වැඩීම ජෛව විවිධත්වයක් පෙන්නුම් කරන රට ශ්‍රී ලංකාවයි.
* දැනට තහවුරු නොකල දත්ත හා සසඳන විට ලෝකයේ ඕනෑම රටක ඒකක භූමි ප්‍රමාණයක උභයජීවී විවිධත්වයේ වැඩීම අගය පෙන්නුම් කරන රට ශ්‍රී ලංකාවයි.
* ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි වීමෙන් ජගත් ප්‍රජාවට ජීවී විශේෂ වැඩි ගණනක් අහිමිවීමේ අවදානමක් ඇත.